A

# නිවේදනය

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ 2020 ඔක්තෝබර් 29 දින පවත්වන ලද රැස්වීමේ දී කරන ලද ඉල්ලීම අනුව පාර්ලිමේන්තුවේ අන්තර්ජාල පද්ධතියට සහ විද්‍යුත් තැපෑලට ප්‍රවේශවීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට නොහැකි වීම විමර්ශනය කර වාර්තා කිරීම පිණිස තත්කාර්ය කාරක සභාවක් ස්ථාපිත කරන ලද අතර නියෝජ්‍ය කථානායක සහ කාරක සභා සභාපති, ගරු රංජිත් සියඹලාපිටිය මහතාගේ සභාපතිත්වයෙන් යුතුව එකී කාරක සභාවේ  සේවය කිරීම සඳහා මතු නම් සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ම'විසින් නම් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි:—

ගරු කංචන විජේසේකර මහතා

ගරු හරීන් ප්‍රනාන්දු මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

2020.11.24 දින අපර භාග 2.00ට කාරක සභා කාමර අංක 7 හි උක්ත කාරක සභාවේ පළමුවැනි රැස්වීම පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් එම රැස්වීමට පැමිණ සහභාගී වන මෙන් සාමාජික මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

පාර්ලිමේන්තුවේ අන්තර් ජාල පද්ධතිය සහ විද්‍යුත් තැපෑල  පිළිබඳව ඇති ගැටලු සාකච්ඡා කිරීමට මෙම කාරක සභාව අපේක්ෂා කරන බැවින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට ඒවා සම්බන්ධයෙන් තිබෙන ගැටලු කාරක සභාවට ඉදිරිපත් කළ හැකි බව ද දන්වා සිටිමි.